# බදුල්ල පුරවරයේ අස්පර්ශිත හෙළ උරුමයන් පිළිබඳ කෙටි ගවේෂණයක්

ආර්. එම්. එච් රත්නායක
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
haseeupesi71@gmail.com

සිංහලයාගේ විස්කම් විදහා දක්වන ඓතිහාසික උරුමයන්ගෙන් වැසීගිය පින් බිමක් වන ඌව පළාතේ බදුලු දිස්ත්‍රික්කය ප්‍රධාන වේ. පෞරාණික ලෙන් විහාර, බෞද්ධ විහාරස්ථාන, වැව් ආදියෙන් ප්‍රදේශය පිරී පවතී. එසේම වෙල්ලස්ස ලෙසින් නම් ලැබී තිබීමම මෙහි සශ්‍රිකවත් බව කියාපායි. වත්මන් තරුණ පරපුරේ අවධානය ගිලිහෙන යුගයක බදුලු පුරවරයට හිමි ඓතිහාසික වටිනාකම, ස්ථාන කිහිපයක් පර්යේෂණයට බඳුන් කරමින් සිහළ පෞඩත්වයේ අගය කියා දෙමින් ඒවා ඔවුන් උදෙසා ආරක්‍ෂා කර තැබීමත් මෙකී පර්යේෂණයේ අරමුණයි. බුදුරදුන්ගේ පහස ලද මුතියංගණ පුදබිම බෞද්ධයාගේ ප්‍රධාන පිං බිමක් වේ. වළගම්බා රජ සමයට අයත් ලෙන් විහාර අතරින් දෝව ලෙන් විහාරයට විශේෂ තැනක් හිමිවේ. විශාල ගල් පර්වතයක නෙළා ඇති හිටි පිළිමය බෞද්ධ ලෝකයේ විශාලතම හිටි පිළිමයක් වන අතර වහළක් හිමි එකම ලී පාලම ද මෙම රජු සමයේ ඉදි වු බෝගොඩ විහාරයේ පිහිටි බෝගොඩ පාලමය.
පර්යේෂණ ක්‍රමවේදය ලෙසින් සාහිත්‍ය මුලාශ්‍ර, පුරාවිද්‍යා සාධක, අභිලේඛන හා ජනශ්‍රැති, ජනප්‍රවාද අධ්‍යයනයෙන් මෙන්ම සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය ද භාවිතා කරනු ලැබීය. දෝව ලෙන් විහාරය, බෝගොඩ පාලම හා විහාරය, මුතියංගන විහාරය, ආදී සිථාන කිහිපයක් මෙලෙස පර්යේෂණයට බඳුන් විය.ඌව පළාතේ පෞඩත්වය විදහා දක්වන බදුලු පුරවරයේ ඉතිහාසය පිළිබඳව මෙම ස්ථානවලින් පිළිඹිමු වේ. මෙකී ස්ථානවලින් හෙළිවන තොරතුරු මඟින් වත්මන් පරපුරට ලබා දෙන්නේ සුවිශේෂි පණිවිඩයකි. චිත්‍ර කලාව, කැටයම් කලාව මෙන්ම කළුගලින් අලංකාර නිර්මාණයන් බිහිකළ අපේ මුතුන් මිත්තන්ගේත් වත්මන් පරපුරට ද ඒවා අධ්‍යයනය කරමින් එවැනි සුවිශල් නිර්මාණයන් බිහිකිරීමට හැකි බව කියාදෙයි. එසේම මේ තුළින් අපගේ පැරණි අස්පර්ශිත උරුමයන් පිළිබඳ දැනුම ලේඛනගත කොට ඒවා වියැකි යා නොදී මතු පරපුර උදෙසාත්, ඒවා නිරීක්ෂණය කළ මුතුන් මිත්තන්ට කෙරෙන උපහාරයක් වශයෙනුත් මේ පර්යේෂණය හැඳින්විය හැක.

**ප්‍රමුඛ පද -** බදුල්ල; අස්පර්ශිත; උරුමය; ඌව